**කොළඹ විශ්ව විද්‍යාලය, ශ්‍රී ලංකාව**

**නීති පීඨය**

**නීතිවේදී උපාධි පරීක්ෂණය (මාගර්ගත), පළමු වසර - 2021**

# ශ්‍රී ලංකාවේ නීති පද්ධතිය

(පැ තුනයි)

මුළු ප්‍රශ්න සංඛ්‍යාව: හයයි (06)

ප්‍රශ්න පත්‍රයේ ඇති පිටු සංඛ්‍යාව: හතරයි (04)

ඕනෑම ප්‍රශ්න **<u>තුනකට (03) පමණක්</u>** පිළිතුරු සපයන්න.

(අපැහැදිලි අත්අකුරු සඳහා ලකුණු අඩු කරනු ලැබේ.)

---

01. ශ්‍රී ලංකාව තුළ අදාළ වන රෝම ලන්දේසි නීතියේ මූලාශ්‍ර කාලයාගේ ඇවෑමෙන් පරිණාමය වී ඇති අතර රටේ බහුවිධ නීති පද්ධතියේ පොහොසත්කම විදහා දක්වයි. කෙසේවෙතත්, 1799 ප්‍රකාශනයේ සීමාකාරී අර්ථනිරූපණය රෝම ලන්දේසි නීතියේ වර්ධනය සහ ශ්‍රී ලංකාවේ නීති පද්ධතියට එමගින් කළ හැකි දායකත්වය අඩාල කර ඇත.

අදාළ නෛතික බලධාරීන් උපුටා දක්වමින් ඉහත ප්‍රකාශය සාකච්ඡා කරන්න.

(ලකුණු 100)

02. තමන් සතු බඩඉරිගු තොගය රු. 200,000/= ට විකිණීමට කැමති බවත් නිමල්ට එය මිලදීගැනීමට අවශ්‍ය නම් දින හතරක් ඇතුළත මුදල් රැගෙන ආ යුතු බවත් දන්වමින් සරත් නිමල්ට ලියුමක් ලිව්වේය. ඊට ප්‍රතිචාර වශයෙන් නිමල් රු. 50,000/= ක අත්තිකාරම් මුදලක් සරත් වෙත යවා දින දහයක් ඇතුළත සම්පූර්ණ මුදල ගෙවන බව සඳහන් කළේය. එහෙත් දින දහය ඇතුළත සම්පූර්ණ මුදල ගෙවීමට නිමල් අපොහොසත් විය. මේ අතර සුනිල්ගෙන් සරත්ට ඉතා හොඳ මිලක් ලැබුණු අතර සරත් තම බඩ ඉරිගු තොගය සුනිල්ට විකිණීය. නිමල් තර්ක කරනුයේ ඉංග්‍රීසි නීතියේ අගනා ප්‍රතිෂ්ඨාව (valuable consideration) යන සංකල්පය ගිවිසුම් සඳහා අදාළ වන බැවින් ඔහු හා සරත් අතර වලංගු ගිවිසුමක් ඇතිව තිබූ බවයි. නිමල් නියමිත කාලය තුළ කටයුතු කිරීමට අපොහොසත්වීම මත නිමල්ගේ ක්‍රියාව වලංගු ගිවිසුමක් ලෙස නොසැලකීමට ඔහුට සාධාරණ හේතුවක් (justa causa) තිබූ බව සරත් තර්ක කරයි.

ශ්‍රී ලංකාව තුළ ඉංග්‍රීසි නීතියේ අගනා ප්‍රතිෂ්ඨාව යන සංකල්පයෙහි යෙදීම පිළිබඳව විශේෂ අවධානයක් යොමු කරමින් ඉහත පාර්ශ්වයන්ට උපදෙස් ලබා දෙන්න. අදාළ නෛතික බලධාරීන් ඇසුරින් ඔබේ පිළිතුර සනාථ කරන්න. ශ්‍රී ලංකා නීති පද්ධතිය තුළ ඉංග්‍රීසි නීතියේ සමස්ත අදාළත්වය භාවිත කරමින් ඔබේ පිළිතුර සනාථ කළ හැකිය.

(ලකුණු 100)

03. (අ) සහ (ආ) යන දෙකටම පිළිතුරු සපයන්න.

(අ) 'උඩරට නීතිය අදාළ වන්නේ තමන් උඩරට ලෙස හඳුන්වාගන්නා තැනැත්තන්ටය. 1815 දී බ්‍රිතාන්‍යයන් යටත් කර ගන්නා විට ඔවුන් මහනුවර සහ ඒ අවට ප්‍රදේශවල ස්ථිර පදිංචිකරුවන්ගෙන් පැවතෙන්නන් වේ.'

ඔබ එකඟවන්නෙහිද? විශේෂ නීතියක් ලෙස උඩරට නීතියේ අදාළත්වය ඉහත ප්‍රකාශය ඇසුරින් සාකච්ඡා කරන්න. අදාළ ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන හා අධිකරණ තීරණ අධිකාරීන් ඇසුරින් ඔබේ පිළිතුර සනාථ කරන්න.

(ලකුණු 50)

(ආ) රන් මැණිකා තෙල්දෙණියේ රන්දෙණිය පවුලේ බාල දියණියයි. ඇය ශ්‍රී ලංකාවේ සහ ජර්මනියේ ද්වි ත් පුරවැසිභාවය හිමි ගාල්ලේ පදිංචි ජර්මන් ජාතික ඩේවිඩ් සමඟ විවාහ වූවාය. විවාහ වී වසර දෙකකට පසු ඩේවිඩ් සිය ව්‍යාපාරික කටයුතු සඳහා ජර්මනියට ගිය බැවින් රන් මැණිකා සිය පුත් ජෝර්ජ් සමඟ තෙල්දෙණියේ පිහිටි ඇගේ පාරම්පරික නිවසේ පදිංචියට පැමිණියාය. 2018 වසරේ සිට රන් මැණිකා තම අවිවාහක වැඩිමහල් සොහොයුරිය වන බිසෝ මැණිකා සමඟ පාරම්පරික නිවස බෙදාහදා ගනිමින් තෙල්දෙණියේ පදිංචිව සිටියාය. 2019 දී ඩේවිඩ් ශාන්ත පීටර්ස්බර්ග් වෙත පියාසර කරමින් සිටියදී ගුවන් යානා අනතුරකින් මිය ගියේය. එකී අනපේක්ෂිත තත්ත්වය සහ ඇගේ සහෝදරියගේ ආර්ථික දුෂ්කරතා හේතුවෙන් බිසෝ මැණිකා රන් මැණිකාට තම පුතා සමඟ පාරම්පරික නිවස භුක්තිවිඳීමට ඉඩ දුන්නාය. දැන්, ජෝර්ජ් මහනුවර ජාත්‍යන්තර පාසලකට ඇතුළත් කිරීමට විශාල මුදලක් වැය කිරීමට සිදුවන බව පවසමින් රන් මැණිකා තම තෙල්දෙණියේ දේපළවලින් කොටසක් ඉල්ලා සිටින්නීය. තවද, රන් මැණිකා පවසන්නේ 2018 වසරේ සිට තම පාරම්පරික නිවසේ ජීවත් වීමට පටන් ගත් බැවින් තම දීග විවාහය බින්න විවාහයක් බවට පරිවර්තනය වී ඇති බවයි.

උඩරට නීතියට අනුව රන් මැණිකාට අදාළ වන නීතිමය ආනුෂංගයන් පැහැදිලි කරන්න. අදාළ ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන හා අධිකරණ තීරණ අධිකාරීන් ඇසුරින් ඔබේ පිළිතුර සනාථ කරන්න.

(ලකුණු 50)

04. නිබිලාගේ මාතෘ පාර්ශ්වයේ මුතුන් මිත්තන් කේරලයේ සිට ශ්‍රී ලංකාවට පැමිණි දා සිට නිබිලාගේ පවුල ජීවත් වන්නේ යාපනයේ ය. ඇගේ දෙමාපියන් සිවිල් යුද්ධය පැවති කාලයේ කෙටි කලකට රට හැර ගොස් සිටියදී නිබිලා දකුණු ඉන්දියාවේ කුඩා ගම්මානයක උපත ලැබීය. නමුත් ඇගේ පවුල ඇයට අවුරුද්දක් වයසැති විට නැවත යාපනයට පැමිණ ඇගේ මවට අයත් පාරම්පරික නිවස සහ ඇගේ පියාට අයත් ඉඩම් නැවත ලබා ගත්හ. නිබිලා තෘතියික අධ්‍යාපනය සඳහා මහනුවරට යන තුරුම යාපනයේ ඉගෙනුම ලැබුවාය. එහිදී ඇය ගාල්ලේ සිට පැමිණි ඇගේ කණ්ඩායම් සාමාජිකයෙකු වන තිස්ස සමඟ ප්‍රේම සම්බන්ධතාවක් ඇතිකරගත්තාය. විශ්වවිද්‍යාලයෙන් පිටවූ විගස මහනුවරදී විවාහ වූ ඔවුන් මහනුවර මහ රෝහලේ සේවය කිරීමට මහනුවර පදිංචි වූහ. විවාහ වී පළමු වසර තුළ නිබිලා සෑම මසකම තම දෙමාපියන් බැලීමට ගිය නමුත් පසුව යාපනයට යාමට නොහැකි වූයේ ඇය සහ තිස්ස ඔවුන්ගේ පශ්චාත් උපාධිය සඳහා සිංගප්පූරුවට ගිය බැවිණි. වසර හයකට පසු නිබිලා තිස්සගෙන් දික්කසාද වී යාපනයේ පිහිටි ඇගේ පාරම්පරික නිවසට පැමිණියාය. ඇය එහි ජීවත් වූ අතර ඇගේ මව පිළිකාවක් හේතුවෙන් අසනීප වීමට පෙර යාපනය රෝහලේ වසරක් සේවය කළාය. මාස හයකට පසු ඇගේ මව මිය ගිය අතර නිබිලා ඔවුන්ගේ ගමේ කෝවිලේ මවගේ අවමංගල්‍ය කටයුතු සිදු කළාය.

ඇගේ මව මුතුන් මිත්තන්ගේ නිවස ඇයට ලබාදී ඇති බව නිබිලා පසුව සොයා ගනී. ඇගේ සොහොයුරා වන රන්දීප් පවසන්නේ ඔවුන්ගේ මවට පාරම්පරික දේපළ අත්හැරීමට නීත්‍යානුකූල හැකියාවක් නොමැති බවයි. තවද, නිබිලා පිටස්තරයෙකු සමඟ විවාහ වී තම නිවස අතහැර ගිය බැවින් ඇය තවදුරටත් තේසවලමෙන් පාලනය නොවන බව රන්දීප් පවසයි.

තම සොහොයුරාගේ ප්‍රකාශයන් නීතිමය වශයෙන් වලංගු වන්නේද යන්න දැනගැනීමට නිබිලාට අවශ්‍ය වේ. අදාළ ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන හා නඩු තීන්දු නීතිය ඉස්මතු කරමින් ඉහත කරුණු සාකච්ඡා කරන්න.

(ලකුණු 100)

05. නිසාර් සහ ෆාතිමා විවාහ වූයේ 1993 වර්ෂයේදීය. ඔවුන්ට ඔවුන්ගේම දරුවෙකු නොසිටි බැවින්, ඔවුන්ගේ විවාහයෙන් වසර 6 කට පසු ඔවුන් සහරා කුලවද්දා ගත්හ. පසුව, නිසාර් සහ ෆාතිමාට පුතෙකු ලැබුණු අතර ඔහුට මොහොමඩ් යන නම තැබීය. පසුගියදා නිසාර් සහ ෆාතිමා රිය අනතුරකට ලක්ව රෝහලේ ප්‍රතිකාර ලබමින් සිටියදී මිය ගියහ. ඔවුන්ගේ අභාවයෙන් පසු, ඔවුන්ගේ සහජාත පුත්‍රයා වන මොහොමඩ් සහරා සමඟ දබර වූ අතර ඔහු ඇයට වහාම නිවසින් පිටව යන ලෙස ඉල්ලා තිබේ. සහජාත පුත්‍රයා ලෙස නිසාර්ගේ සහ ෆාතිමාගේ දේපළ අයිතිය ඇත්තේ තමාට පමණක් බවත්, මුස්ලිම් නීතිය යටතේ පවා ඇය ඔවුන්ගේ දියණිය ලෙස නොසලකන බවත් ඔහු ප්‍රකාශ කරයි. කෙසේ වෙතත්, සහරා තර්ක කරන්නේ ඇයට මොහොමඩ් මෙන්ම සමාන අයිතිවාසිකම් හිමිවන බැවින් නිසාර්ගේ සහ ෆාතිමාගේ දේපළ

සම්බන්ධයෙන් ඇගේ අනුප්‍රාප්තික අයිතිවාසිකම් ඉල්ලා සිටී. ඇයගේ ඉල්ලීමට ප්‍රතිචාර දක්වමින් මොහොමඩ් ප්‍රකාශ කරන්නේ නිසාර් විසින් තෑගි ඔප්පුවකින් ඇයට ලබාදුන් රත්මලානේ පිහිටි නිවස හැර මුස්ලිම් නීතිය යටතේ නිසාර්ගේ සහ ෆාතිමාගේ අන්තිම කැමතිපත්‍ර රහිත දේපළ සම්බන්ධයෙන් ඇයට කිසිදු අයිතියක් නොමැති බවයි.

සහරා මේ පිළිබඳව ඔබේ උපදෙස් පතයි. අදාළ ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන හා නඩු තීන්දු නීතිය උපුටා දක්වමින් ඇයට උපදෙස් දෙන්න.

(ලකුණු 100)

06. නීති උපාධිය හදාරන පළමු වසර උපාධි අපේක්ෂකයන් සඳහා 'ශ්‍රී ලංකාවේ වර්තමාන යුක්තිය පසිඳලීමේ ක්‍රමය සහ එහි කාර්යක්ෂමතාවය' පිළිබඳ ආරාධිත දේශනයක් පැවැත්වීමට ඔබව කැඳවා ඇතැයි උපකල්පනය කරන්න.

ඔබේ දේශනය තුළ ඔබ අවධානය යොමු කරන ප්‍රධාන කරුණු සාකච්ඡා කරන්න. පවතින අධිකරණ පද්ධතියේ ධූරාවලිය සහ ඒවායේ අධිකරණ බලය පිළිබඳව අවධානය යොමු කිරීම ඔබගෙන් අපේක්ෂා කෙරේ. පවතින ක්‍රමයේ කාර්යක්ෂමතාවය පිළිබඳව අදහස් දැක්වීමට සහ පවතින ක්‍රමය ප්‍රතිසංස්කරණය කිරීමේ බලගතු අවශ්‍යතාවයක් තිබේද යන්න සාකච්ඡා කිරීමටද ඔබෙන් තවදුරටත් අපේක්ෂා කෙරේ.

(ලකුණු 100)